(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 312.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2013 නොවැම්බර් මස 23 වැනි සෙනසුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2700/'12

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රැකියා සඳහා විදේශගතවූවන්ට ඔවුන් උපයනු ලබන ආදායමෙන් ඇමෙරිකන් ඩොලර් 20000ක මුදලක් ශ්‍රී ලංකාවේ බැංකුවක තැන්පත් කිරීමෙන් පසු තීරු බදු සහන යටතේ මෝටර් රථයක් මෙරටට ගෙන්වා ගැනීමේ පහසුකම ලබා දී තිබුණේද;

(ii) එම පහසුකම මේ වනවිට අත්හිටුවා තිබේද;

(iii) එසේ නම්, ඊට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් පරිදි තීරු බදු සහන යටතේ වාහනයක් ලබා ගැනීමට තිබූ පහසුකම නැවත ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3111/'12

2.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කොළඹ කොටස් හුවමාරුවට අදාළව සිදුවන,

(i) වංචා සහගත අභ්‍යන්තර ගනුදෙනු සම්බන්ධයෙන් ආරම්භයේ සිට විමර්ශනය කොට කටයුතු කරන ලද සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිද්ධීන්හි නම්, ඒ හා සම්බන්ධ මුදල් ප්‍රමාණයන් සහ ඒ සම්බන්ධව එළැඹුණු අවසාන තීරණයන් කවරේද;

(iii) කෘත්‍රිම ලෙස මිල ඉහළ යෑමට සලස්වා කොටස් අධි මිලට අලෙවිකිරීම (Pump and Dump) වැනි වෙළෙඳපළ අයුතු ලාභ චේතනාවෙන් හැසිරවීමේ කටයුතුවලට සම්බන්ධ සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත සිද්ධීන්ට අදාළව එම චූදිතයන්ගේ නම්, විමර්ශනය සිදු කළ දිනයන් සහ ඒ සම්බන්ධයෙන් එළැඹි අවසාන තීරණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කොටස් හුවමාරුවේ සිදුවන ගනුදෙනු සම්බන්ධයෙන් සමාගම් සැකයට භාජනය වූ අවස්ථා ගණන කොපමණද;

(ii) එසේ සැකයට භාජනය වූ සමාගම්වල නම් කවරේද;

(iii) එසේ එකී සමාගම් ගැන සැක පහළවීමට හේතු කවරේද;

යන්නත් පසුගිය වර්ෂ 5ට අදාළව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කොටස් හුවමාරුව තමන්ට වාසිදායක ලෙස අයුතු ලාභ චේතනාවෙන් හසුරුවන්නන් මගහැර යාමට තරම් පවතින නීති ප්‍රමාණවත්ද;

(ii) එසේ නොමැති නම්, එලෙස අයුතු ලාභ චේතනාවෙන් තමන්ට වාසිදායක ලෙස කොටස් ගනුදෙනු හැසිරවීම පාලනය කිරීම සඳහා ඇති විසඳුම් හා යෝජනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3262/'12

3.

ගරු රෝසි සේනානායක මහත්මිය,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හෝමාගම-හබරකඩ ළමා සහ මාතෘ සායන මධ්‍යස්ථානයේ නවීකරණ කටයුතු සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එකී ඇස්තමේන්තුගත මුදලින් නවීකරණ කටයුතු සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම මධ්‍යස්ථානයේ නවීකරණ කටයුතු ආරම්භ කළ හා අවසන් කළ දින කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නවීකරණ කටයුතුවලට පෙර, ඉහත සඳහන් මධ්‍යස්ථානයේ එක් මාසයක් තුළදී පැවැත්වූ ළමා සහ මාතෘ සායන සංඛ්‍යාව කොපමණද;

(ii) එහි නවීකරණ කටයුතුවලින් පසුව, මේ වනවිට එක් මාසයකදී පවත්වනු ලබන ළමා සහ මාතෘ සායන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3290/'12

4.

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) කොළඹ, මරදාන ප්‍රදේශයේ පිහිටි අල් අතීස් විදේශ රැකියා ආයතනය මගින් ඩබ්ලිව්. එම්. සුරේඛා ද සිල්වා යන තරුණිය රැකියාවක් සඳහා සෞදි අරාබියට යවා ඇති බවත්;

(ii) එහිදී ඇය මිය ගොස් ඇති බවත්;

(iii) ඇය විදේශගත කිරීමට එම විදේශ රැකියා ආයතනය ව්‍යාජ පොලිස් වාර්තා ඇතුළු ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ව්‍යාජ තොරතුරු මත ඉහත සඳහන් තරුණිය විදේශගත කිරීමට ක්‍රියා කළ එම ආයතනයට විරුද්ධව ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සුරේඛා ද සිල්වා නමැත්තිය මියයාමට හේතුව මේ වන විට අනාවරණය කරගෙන තිබේද;

(ii) එසේ නම්, එම හේතුව කවරේද;

(iii) එම මරණයට අදාළ මරණ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(iv) මියගිය තරුණිය වෙනුවෙන් ඇයගේ දෙමාපියන්ට හිමිවිය යුතු වන්දි මුදල් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3377/'12

5.

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ ඇති කොට්ඨාස අධ්‍යාපන කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල නම් කවරේද;

(iii) 2012 වර්ෂය වන විට එම එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ වසා දමා ඇති පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල සිටින වැඩබලන විදුහල්පතිවරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වැඩබලන විදුහල්පතිවරු සිටින පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික්කවල එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ සිටින ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් අතරින් පාසල් ලබාදී නොමැති විදුහල්පතිවරුන්ට පාසල් ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) ශ්‍රේණිධාරී විදුහල්පති පත්වීම් ලබා ඇති ගුරුවරු සිටින පාසල්වලටත් වැඩබැලීමේ විදුහල්පතිවරුන් පත් කර තිබේද;

(iv) එසේ නම්, එවැනි පත්වීම් සිදුකර ඇති අනුරාධපුර සහ පොළොන්නරු දිස්ත්‍රික්කවල ඇති පාසල්, ඒවා අයත් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3726/'13

6.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා පාසල්වල පිහිටුවා ඇති ශිෂ්‍යභට කණ්ඩායම් සංඛ්‍යාව කොපමණද;

(ii) ආසන්න වශයෙන් එම කණ්ඩායම් නියෝජනය කරන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) 1985 අංක 40 දරන මිනිස්බල උපයෝගීතා පනත අනුව ශිෂ්‍යභට බලකා මූලස්ථානයේ සේවා වනිතා ඒකකයක් පිහිටුවීමට හැකිද;

(iv) ශිෂ්‍යභට බලකා මූලස්ථානයේ ශ්‍රවණාගාරයක් ඉදිකිරීම වෙනුවෙන් එක් ශිෂ්‍යභට සිසුවෙකුට රු. 2500 ක් වටිනා ටිකට්පත් විකිණීමට උපදෙස් දී තිබේද;

(v) එමගින් අපේක්ෂිත ආදායම කවරේද;

(vi) එසේ ටිකට්පත් අලෙවියක් සිදුකිරීම සඳහා ඇති නීතිමය අවසරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3750/'13

7\.

ගරු සුජීව සේනසිංහ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(ii) එම වරාය ඉදිකිරීමට වැය කළ මුළු මුදල කොපමණද;

(iii) එම වරායේ ඉදිකිරීම් ආරම්භ කළ දිනය සහ ඉදිකිරීම් අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දික්ඕවිට ධීවර වරාය තුළ හැසිරවිය හැකි ධීවර යාත්‍රා වර්ග කවරේද;

(ii) එහි හැසිරවිය හැකි ඉහත සඳහන් එක් එක් යාත්‍රා වර්ගවල සංඛ්‍යාවන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වරාය ඔස්සේ දෛනිකව ලැබෙන මත්ස්‍ය අස්වනු ප්‍රමාණය කොපමණද;

(iv) මේ වන විට එම වරාය මගින් ලබා දී ඇති සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව කොපමණද;

(v) එම වරාය ඉදිකිරීම තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂා කළ අරමුණු කවරේද;

(vi) එම අරමුණු මේ වනවිට ඉටුවී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3080/'12

8\.

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවාව සඳහා නව සේවා ව්‍යවස්ථාවක් සකස් කරමින් හෝ සකස් කර තිබේද;

(ii) ඒ තුළින් ආයුර්වේද වෛද්‍යවරුන් හෑල්ලුවට ලක් වන බවට චෝදනාවක් ඇති බව දන්නේද;

(iii) ආයුර්වේද වෛද්‍යවරයාගේ ගෞරවය රැකෙන ආකාරයට නව සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාරම්පරික වෙද පරම්පරා රැක ගැනීමටයැයි පවසමින් සුදුසුකම් නොමැති පුද්ගලයන්ට පෞද්ගලික ආයතන හරහා දේශීය වෛද්‍ය ඩිප්ලෝමාවන් ලබා දෙන බව දන්නේද;

(ii) මෙය ආයුර්වේද වෛද්‍ය විද්‍යාලවල උපාධි ලබාගන්නා ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට කරනු ලබන බලවත් අසාධාරණයක් බව පිළිගන්නේද;

(iii) එම අසාධාරණය ඉවත් කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3122/'12

9.

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වවුනියාව - යාපනය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළව,

(i) මාර්ගයේ දිග කොපමණද;

(ii) ප්‍රතිසංස්කරණය සඳහා ගන්නා ලද කාලය කොපමණද;

(iii) ඉදිකිරීම්කරු තෝරාගනු ලැබුවේ ටෙන්ඩර් පරිපාටියක් මගින්ද;

(iv) එසේ නම්, තෝරාගනු ලැබූ ලංසුකරුගේ නම කවරේද;

(v) මුදල් ලබාගන්නා ලද මූලාශ්‍ර කවරේද;

(vi) එක් කිලෝමීටරයකට ඉදිකිරීම් පිරිවැය කොපමණද;

(vii) කිසිවෙකුට හෝ වන්දි ප්‍රදානය කරනු ලැබ තිබේද;

(viii) එසේ නම්, වන්දි ප්‍රදානය කරනු ලැබ ඇති පුද්ගලයින්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3379/'12

10.

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාත් සභාව මගින් පාලනය කරනු ලබන රෝහල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් රෝහල සඳහා අනුමත වෛද්‍යවරු, හෙදියන්, රෝහල් කම්කරුවන් හා අනෙකුත් අනුමත කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝහල් අතරින් අනුමත කාර්ය මණ්ඩලයේ ඇති පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් රෝහල අනුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උතුරු මැද පළාත් සභාව මගින් 2012 වර්ෂය සඳහා එම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම මුදලින් රෝහල්වල සිදුකළ සේවාවන් කවරේද;

(iii) 2012 වර්ෂයේදී උතුරු මැද පළාතේ එක් එක් රෝහල වෙතින් ප්‍රතිකාර ලබා ගෙන ඇති රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) සමස්තයක් වශයෙන් එම වර්ෂය තුළ ප්‍රතිකාර ලබාගත් එක් රෝගියෙක් සඳහා උතුරු මැද පළාත් සභාවෙන් වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3728/'13

11.
ගරු අනුර දිසානායක මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ කිහිපයකට පෙර විවෘත කරන ලද රන්මිණිතැන්න ටෙලි සිනමා ගම්මානය 2013 මාර්තු 05 වැනි දින නැවත විවෘත කිරීමට හේතු කවරේද;

(ii) පළමු විවෘත කළ දිනයේ සිට 2013 මාර්තු දක්වා එහි සිදුවූ කලා කටයුතු කවරේද;

(iii) ටෙලි සිනමා ගම්මානයක් ලෙස එම ව්‍යාපෘතිය සඳහා මේ වන විට වියදම්කර ඇති සමස්ත මුදල කොපමණද;

(iv) එම ගම්මානය විවෘත කිරීමේ අවස්ථා දෙක සඳහා සිදුකළ වියදම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) කලා ක්ෂේත්‍රයේ දියුණුව සඳහා එම ස්ථානය යොදා ගැනීමට ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3732/'13

12.
ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අතිරේක සාමාන්‍යාධිකාරී ධුරය දරන අයගේ නම කුමක්ද;

(ii) එම තනතුර දරන අය ලබන මාසික වැටුප හා දීමනා කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියෝජිතායතනයේ සාමාන්‍යාධිකාරී ධුරය දරන අයගේ නම කුමක්ද;

(ii) එම තනතුර දරන අය ලබන මාසික වැටුප හා දීමනා කොපමණද;

(iii) එම තනතුර දරන පුද්ගලයා සහ විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමා අතර ඥාති සබඳතාවක් තිබේද;

(iv) එසේ නම්, එම සබඳතාවය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එකම පුද්ගලයෙකුට ඉහත සඳහන් ආයතන දෙකෙහිම තනතුරු දැරීමේ හැකියාවක් තිබේද;

(ii) ඒ අනුව, ආයතන දෙකක තනතුරු දැරීම වරදක් නම්, එය නිවැරදි කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3123/'12

13.

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුරය - වවුනියාව මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළව,

(i) මාර්ගයේ දිග කොපමණද;

(ii) ප්‍රතිසංස්කරණය සඳහා ගන්නා ලද කාලය කොපමණද;

(iii) ඉදිකිරීම්කරු තෝරාගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් මගින්ද;

(iv) එසේ නම්, තෝරාගනු ලැබූ ලංසුකරුගේ නම කවරේද;

(v) මුදල් ලබා ගන්නා ලද මූලාශ්‍ර කවරේද;

(vi) එක් කිලෝමීටරයකට ඉදිකිරීම් පිරිවැය කොපමණද;

(vii) කිසිවෙකුට හෝ වන්දි ප්‍රදානය කරනු ලැබ තිබේද;

(viii) එසේ නම්, වන්දි ප්‍රදානය කරනු ලැබ ඇති පුද්ගලයින්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත (2014) — (දෙවැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2013 නොවැම්බර් 21) [1]

*2.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ

යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ධසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ධසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

9.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

10.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

11.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

12.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

13.

මෛත්‍රීපාල සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

14.

හැන්ඩ්ස් ෆෝ එඩියුකේෂන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

2905/'12

1.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු දිනයේ සිට අද දක්වා ශ්‍රී ලංකාව පාලනය කර ඇති රජයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i)හි සඳහන් කරන ලද එක් එක් රජයෙහි ආරම්භයේ සිට අවසානය දක්වා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 1985, 1995, 2005 සහ 2012 යන වර්ෂයන්වලදී එක් අමාත්‍යවරයෙකු වෙනුවෙන් දරන ලද සාමාන්‍ය පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් සභා පනත මගින් පළාත් සභාවන්හි අමාත්‍යවරු සංඛ්‍යාව සීමාකර ඇති ආකාරයට, කැබිනට් අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව නීතියෙන් සීමා නොකිරීමට හේතුව කවරේද;

(ii) කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව වැඩි කිරීමෙන් රටට යහපතක් වී තිබේද; එසේ නැතහොත්, එමගින් රටට වැඩි බරක් පැටවී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3289/'12

2.

ගරු අජිත් කුමාර මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය හේතුවෙන් ගාල්ල දිස්ත්‍රික්කය තුළ වසා දමන ලද හෝ ඉදිකිරීම් කටයුතුවලදී භාවිතා කරන ලද පළාත් පාලන ආයතනවලට අයත් මාර්ගයන්හි විස්තරාත්මක තොරතුරු පළාත් පාලන ආයතන මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම මාර්ගවලට වූ හානිය වෙනුවෙන් දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය මගින් හෝ රජයේ වෙනත් ආයතනයක් මගින් අදාළ පළාත් පාලන ආයතනවලට මුදල් ප්‍රතිපාදන ලබා දුන්නේද;

(iii) එසේ නම්, ඉහත පරිදි ලබා දුන් මුදල් භාවිතා කොට එම පළාත් පාලන ආයතන විසින් අදාළ මාර්ග සකස්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත අ (ii) හි පරිදි ප්‍රතිපාදන ලබා දුන්නේ නම්,

(i) මුදල් ලබා දුන් ආයතනය;

(ii) මුදල් ලබා දුන් අදාළ මාර්ග;

(iii) එක් එක් මාර්ගය වෙනුවෙන් ලබා දුන් මුදල හා අදාළ දිනය;

කවරේද යන්න එක් එක් පළාත් පාලන ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?